# ධම්මපදය

## චිත්ත වර්ගය (10 ගාථාව)

**10.** ගාථාව

**දිසෝ දිසං යංතං කයිරා - වේරී වා පන වේරිනං**
**මිච්ඡාපණිහිතං චිත්තං - පාපියෝ නං තතෝ කරේති**

පදගතාර්ථය

| | |
|---|---|
| **දිසෝ** | - සොරෙක් |
| **දිසං** | - සොරෙකුට |
| **වේරී** | - වෛරකාරයෙක් |
| **වේරිනං** | - වෛරකාරයෙකුට |
| **යං තං** | - යම් ඒ අවැඩක් |
| **කයිරා** | - කෙරේ ද |
| **මිච්ඡාපණිහිතං චිත්තං** | - වරදවා තැබූ සිත |
| **තතෝ** | - එයට වඩා |
| **නං** | - ඔහු |
| **පාපියෝ කරේ** | - පව්ටෙකු කරන්නේ ය. |

භාවාර්ථය

සොරෙක් තවත් සොරෙකු දැක යම් අවැඩක් කරන්නේ ද වෛරකාරයෙක් තවත් වෛරකාරයකුට යම් අවැඩක් කරන්නේ ද වරදවා පිහිටවූ සිත එයටත් වඩා ඔහු ලාමක පුරුෂයකු, පාපියකු කරන්නේ ය.

නිදාන කථාව

අනේපිඬු මහසිටාණන්හට ගවයන් රක්නා ධනවත් නන්ද නම් එඬේරෙක් විය. ඔහු එඬේරකමින් රාජ-බලි (අය බදු) පරිහරණය කරමින් ස්වකීය පවුල රැක බලා ගනී. කලින් කල අනේපිඬු සිටාණන්හට පස්ගෝරස ගෙන යන්නේ එහි දී බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැහැද බුදුරජාණන් වහන්සේට තමන්ගේ නිවසට වඩින්නට ආරාධනා කළේ ය.

එහෙත් බුදුරජාණන් වහන්සේ එහි නො වැඩ ඔහුට නුවණ මෝරන තුරු කල් බලමින් හුන් සේක. ඒ අතර ක්‍රමයෙන් ඔහුගේ නුවණ මේරුවේ ය. එවිට බුදුරජාණන් වහන්සේ භික්ෂුසංඝයාත් සමග චාරිකාවේ වඩිනා සේක් ඔහුගේ නිවසට නො දුරෙහි වූ එක්තරා ගසක් මුල වැඩහුන් සේක.

නන්ද තෙමේ ඒ බව දැන බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ පිළිසඳර කතා කොට බුදුරදුන් පවරා සත් දවසක් භික්ෂුසංඝයාට පංචගෝරස දන් දුන්නේ ය. සත්වැනි ද බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළ සේක. ඒ අවසන්හි ඔහු සෝවාන් විය. ඉන්පසු බුදුරදුන්ගේ පාත්‍රය ගෙන බුදුරජාණන් වහන්සේගේ පසු පස ගියේ ය.

එසේ බොහෝ දුර ගිය ඔහුට 'නවතින්න යැ'යි වදාළ විට නැවතුනේ ය. ඒ වෙලාවෙහි ම ඔහු එක්තරා වැද්දකු විසින් විද්ද වූ හී පහරට හසු වී මැරී වැටුණේ ය. භික්ෂූන් වහන්සේලා ඒ දැක බුදුරදුන්ට ළං ව 'ස්වාමීනි, නන්ද තෙමේ වැද්දකුගේ හී පහරට හසු වී මළේය. භාග්‍යවතුන් වහන්සේගේ පසුපස නො ගියේ නම්, ඔහුට මේ අනතුර සිදු නො වන්නේ' යැ' යි පැවසූහ.

'මහණෙනි, මා ආවත් නාවත්, මා පසුපස ගියත් නො ගියත් ඔහුට ඒ මරණය වන්නේ ය. මෙයින් නිදහස් වීමට උපායක් ඔහුට නැත. ඔහු සතර-දිගට සතර-අනුදිගට ගියේ ද මරණයට පත්වන්නේ ය. මෙය සොරුන් විසින් හෝ සතුරන් විසින් හෝ කරන දෙයක් නො වේ. මෙය කරන්නේ ඒ ඒ සත්ත්වයන් විසින් වරදවා පිහිටුවන ලද දූෂිත වූ සිත ය' යි වදාරා -

**'දිසෝ දිසං යං තං කයිරා'** යන ගාථාවෙන් ධර්මය දේශනා කළ සේක.

මේ ධර්මදේශනාවසානයෙහි බොහෝ දෙනා සෝවාන් ඵලාදියට පැමිණියහ. ධර්මදේශනාව මහජනයාට වැඩ සහිත විය. නන්ද උපාසකයා විසින් අන්‍ය භවයක දී කළ කර්මය භික්ෂූන් නො විචාළ බැවින් බුදුරජාණන් වහන්සේ නො වදාළ සේක.

**ආත්මෝපදේශය** - ඔවදන් නමැති කෙවිටි පහර ලද කල ක්‍රෝධ, මාන සැඟවේ.

සාධු ! සාධු !! සාධු !!!

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(ඉල් 2551)**

**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**<u>පිටු සැකසීම:</u>** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**<u>ධර්මදානය:</u>** පින්වත් දයාසීලී උපාසිකා මාතාව හා උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* www.sadaham.net *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**